ප්‍රියත් ලියනගේ

සර්, නික්ම ගියේය. අපේ සර් යන ගමන් අපේ මචං ද රැගෙන ගියේය.

අපේ සර්, සිංහල සිනමාවේ දැවැන්ත මහා සිනමාකරු, ජාත්‍යන්තර කීර්තියට පත් .....

අපේ මචං: අපිත් එක්ක එකට හොර පොලෙන් අඩි ගැසූ, දැවැන්ත නාසය අදිමින් කැස්ස හැඳෙන තුරු හිනා වුනු, නිරන්තරයෙන් පෙමින් වෙලෙමින් විරහ වේදනාවෙන් හඬන, යතුරු පැදියෙන් ගමන් ගොසි C90 ය ගිය තැන දමා අමතක වී ටැක්සියෙන් ගෙදෙර එන, අප ලවා ගෙන්නා ගත් අරක්කු අපට නොදී තනියම බොන ..... වසන්ත

අසූ ගණන් වල මුල් භාගයේ දෙවසරකට වැඩි කාලයක් දිනපතා පාහේ බම්බලපිටියේ ලෝරිස් පාරේ පිහිටි ඔහුගේ නිවසේ දී

# අපේ සර් අපේ මචං වසන්ත ඔබේසේකර



වසන්ත ඔබේසේකර හඳුනා ගැනීමට මෙන්ම ඔහු ඇසුරේ සිනමා කලාව හදාරන්නට ලැබුණු අවස්ථාව මා ලත් දුර්ලභ භාග්‍යයකි.

අප වැනි තරුණ අඳ බාලයන් සෙවනට ගෙන නොදත් දේ කියා දීමත් නව අදහස් වගා කර ගැනීමට දිරි දීමත් වසන්ත සර් ගේ උතුම් ගුණයකි. සිනමාව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් බව නිරන්තරයෙන් මෙනෙහි කළ ඔහු, රූපය සහ හඬ පටය සමාන්තර වේදනය තුලින් තුන්වැනි තලයක් බිහි කිරීම පිළිබඳ අත්හදා බැලීම් සිදු කරමින් සිනමාවේ නව මානයන් සොයා යමින් සිටියදී නව පරපුර දිරිමත් කිරීම ඔහු තදින් විශ්වාශ කළ දෙයකි.

නිර්මාණ කාර්යයේදී ඔහු තුල වූ කැප වීම සහ වසන්ත ට ආවේනික් අවුල් විනයි තුලින් නිර්මාණයට හවුල්වූ සියල්ලන් ආකර්ෂණයකින් වසඟයට ලක් කර ගැනීමට ඔහු සමත් විය. රූප ගතකරද්දී හිස කෙස් අදිමින් උච්ච ආවේගයට පත්වන අවස්ථා වලදී ත් සොඳුරු සරින් සහෝදර කලාකරුවනට උපදෙස් දෙන විටදීත් ඔහු නිර්මාණයේ දැහැන බිඳ නොගනී.

කිව යුතු දේ කෙලින් කී වසන්ත, නිරන්තර ආවේගයට පත්වූ සියුම් මිනිසෙකි. කලක් සහාය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ක්‍රිස්ටි ෂෙල්ටන් ප්‍රනාන්දු, සම්මානනීය සිනමාකරු ප්‍රසන්න විතානගේ ඇතුළු පිරිස් වසන්ත ඔබේසේකරට සදා ණය ගැති ය. තිර රචනා වේදී ත් චිත්‍රපට නිර්මානයේදී ත් කළ යුතු දේ මෙන්ම නොකළ යුතු දේ වසන්ත සර් ගේ ආදර්ශයෙන් දැක බලා ගන්නට අපට හැකි විය.

ජීවිතය එල්ල කළ අභියෝගයන් හමුවේ දිගින් දිගට නිර්මාණ කාර්යයේ යෙදුනු වසන්ත් සර් සිහින දැකීම අත් නොහල සැබෑ කලාකරුවෙකි.

48 වන පිටට

20 වන පිටෙන්

ප්‍රදර්ශනය වේ.

ශ්‍රී ලංකාවේ අවුරුදු උදානයේ අසිරිමත්ම අනන්‍යතාවය වන්නේ එක යායට ඇසෙන කොවුලාගේ ගී රාවයයි. එය අවුරුදු උදාවට පෙර මෙන්ම පසුවද සැණකෙළියේ ගමන්කරුවා ලෙස පෙනී සිටින්නකි. සොබාදම - සශ්‍රීකත්වය සම්භෝගය අර්ථ නිරූපණය කරන අපූර්ව තම තවත් ගීතයක් හමුවේ. පාරිසරික ගැටළු කෝකිලයාගෙන් ප්‍රශ්න කරමින් සනත් නන්දසිරියන් සුජාතා අත්තනායක මඟ ගී මිහිරක් බවට පත් කිරීමේදී ගම් මැද්දේ රබන් පද හා වනාන්තරයේ බඹර නැටුම කෝකිල කූජනයට කෙතරම් සමපාත වී ඇත්දැයි ප්‍රකාශ වේ.

**ගීත 3**

කොහෝ කොහෝ කොහේ ඉඳන් කොහෝ කියනවදෝ
අපේ ගමේ රබන් පදේ - නුඹට ඇහෙන වදෝ //
කජු නාඹර රස මී අඹ ගස් යට වැහි වැහැ ලා
කොහෝ අන්න අර බලපන් මී වද පැණි පිරිලා
කොහෝ කොහේ //
බක්මාසේ මඟුල් නැකත මොවුන් කියන වදෝ //

රබන් හඬට බඹරු නටන ලස්සන ගම් මැද්දේ
කොහෝ උඹත් ගී කියපන් සිංහල අවුරුද්දේ
කොහේ කොහෝ //
අවුරුදුදට අපේ දිහත් නෑගම් එනවදෝ //

සූර්ය මංගලයය සමයේ රූපවාහිනී මාධ්‍ය පුරා අන්තර්ගතය කරගන්නා ප්‍රාසාංගික වැඩසටහනක් ලෙස රන්වල බලකායේ මේ අවුරුදු කාලේ හිනා වෙයන් රාලේ ගීතයද සඳහන් කළ හැකිය. සම්ප්‍රදායික ජන ගී වලින් පෙරී ආ සුවඳින් යුත් එම ගීතය හා රංගය ගැමියන්ගේ අවුරුදු සැණකෙළියේ උද්දාමය රාව ප්‍රතිරාව නංවන්නකි. කැවුම් ගෙඩිය උළෙලම සංකේත කරවන්නකි. ඔංචිලි වාරම් රබන් සුරල් සමග ගමේ ඩිංගිරි මැණිකෙලා අවුරුදු සිරියාව ඔපවත් කරවයි. ගැමි ගායන හා නැටුම පමණක් නොව ක්‍රීඩනීය රංගන වලින් ප්‍රසංගය ප්‍රයුංජනය වී ඇත.

**ගීතය 4**

මේ අවුරුදු කාලේ සිනහ වෙයන් රාලේ
තෙල් ඉහිරුණු කැවුම් ගෙඩිය වාගේ ආ ආ ආ //
දොං තරිකිට කැත්ත දොදොං -
පිල වටකර කැත්ත දොදොං

දමා තැල්ල ඩිගියි ඩිගොයි -
දමා තැල්ල තක තෙයියා තාං
කැවුම් කොකිස් තෙලේ බැදෙයි -
කැවිලි සුවඳ සිතට දැනෙයි
බා බා බා බා කිකිළී -
ඊයෙ උදේ ගිය කිකිළී
තාම ආවෙ නෑ කිකිළී - බා බා බා
ගත්තිංඥා තිංඥා -
ගති ගත ගෝ ගති ගත ගෝ
ඔන්චිලි වාරම් - ගම දෙවනත් වෙන්නා
(සහන් රන්වල සහ පිරිස)

බක්මහ සැණකෙළිය ජන ක්‍රීඩා, කෙළි සෙල්ලම් විවිධ තරඟාදියෙන් හිමාවක් නැත. ඔළිඳ කෙළිය පන්දු කෙලිය, මේවර කෙළිය, පංච දැමීම, කැට ගැසීම, එළුවන් කෑම, චක්ගුඩු, කොට්ට පොර, තිරික්කල රේස්, කඹ ඇදීම් ආදියේ සිට අවුරුදු කුමාරි තේරීම ආදිය දක්වා අද ඒවා වර්ධනය වී ඇත. ගමේ තරුණ ජවය හා ඔවුනගේ සහභාගීත්වයද උළෙල අලංකාර කරයි. ගමේ පෙම්වතුන් හා පෙම්වතියන් ගේ තරඟකාරී හැසිරීම් කතුරු ඔන්චිල්ලා ආදියේදී ප්‍රකාශ වන්නේ පරිසරය විනෝදජනක කරමිනි. එළුවන් කෑම කොප්පර කොප්පර පිපිඤ්ඤා වැනි අවස්ථා නිරූපණ උත්සවයේ ප්‍රාසංගය උත්කර්ෂවත් කිරීමට හේතු වේ. එඩ්වඩ් ජයකොඩින්ගේ මෙම ගීතය අවුරුදු ක්‍රීඩා උදානය අපට අපූරුවට සිත්තම් කර දක්වයි.

**ගීතය 5**

තැන තැන රවුමට ඉඳගෙන - ඉඳහිට එබිකම් කර කර
ලේන්සු හංගන්න ළමයි - එක් රොක් වන්නා
රවුම වටේ යනවිට කවි පද කියවෙන්නා
කොප්පර කොප්පර පිපිඤ්ඤා - පස්ස බැලුවොත්
දෙසඤ්ඤා //

පැණිමොර මල් පිපුණ රෑට - කජු පුහුලන් ඉඳුනු දාට
පුංචි අපේ සිත් තුළ සතුටක් මතු වෙන් නා
එවන් අසිරි සිරි දුටු සිත් පිනෙන් පිරෙන්නා
කොප්පර කොප්පර //

ගුණ්ඩු පැනල නැටුවෙත් අපි - චච්චි කියල දිනුවෙත් අපි
හරිම වැඩේ අද දරුවන් ඒවා නොදන්නා
වෛවාරණ සෙල්ලම් බඩු ගමට ඇවිල්ලා
කොප්පර කොප්පර //

හැංගි මුත්තං ක්‍රීඩාවට සමානව පිරිස වාඩි වී ගීය ගයති. ලේන්සුවක් සඟවන්නා පිරිස වටේට ගමන් කරන්නේ පස්ස බැලුවොත් දෙසන්නා යනුවෙන් ගායනා කරමිනි. ලේන්සුව ලැබූ තැනැත්තා නොපමාව එය ලබාගෙන දෙවැන්නකුට පිරිනැමිය යුතු වේ. හිස් ඉඩක වාඩි වීමට නොහැකි වූ විට තරඟයෙන් ඉවත් කෙරේ. තනිවූ එලූ පැටවකු ඇල්ලීමට එන කොටියෙකුගෙන් ඌව බේරා ගන්නා පිරිසක් නිරූපණය වන එළුවන් කෑමද ඊට නොදෙවෙනි ප්‍රාසාංගික අවස්ථාවකි. මෙම ගීතය ධ්වනිත කරන්නේ අවුරුදු ක්‍රීඩා මගින් අවුරුදු උළෙල රඟමඩලක් බවට පත් වන ආකාරයයි.

සිංහල දෙමළ අළුත් අවුරුද්ද ජාතික ආගමික පටු භේදවලින් තොරව අසිරිමවත් දේශීය සිරිත් විරිත් පුදමින් ජාතික සමගිය ප්‍රීති ප්‍රමෝදය හා අරමුණු කරගත් එකම ජාති මහෝත්සවය බව පිළිගැවේ. එහි සියළු සිරිත් විරිත් නිමවන්නේ වැඩිහිටියන් වන්දනාමාන කිරීමෙනි. වාද බේද දුරු කර ගනිමින් අවුරුදු ප්‍රාර්ථනා ඉටුකර ගැනීමටත් සිරිලකට සෞභාග්‍ය උදාකිරීමටත් ප්‍රවීණ ගායන ශිල්පී රෝහණ බැද්දගේ ශූරීන් කරන පහත සඳහන් අවුරුදු ප්‍රාර්ථනය අනුව ඕස්ට්‍රේලියාවේ වෙසෙන සියළු ශ්‍රී ලාංකිකයන්ටද සුබ මංගලයයක් ම වේවායි ආශිර්වාද කරමින් ගීත සාහිත්‍ය රස මිහිර මෙයින් නිමාවට පත්කරමි.

**ගීතය 06**

මේ අවුරුද්දේ කිරි ඉතිරෙන්ටයි -
රට වැසියන්ගේ ආයු වැඩෙන්ටයි
රට පුරාම අවුරුදු සිරි මෙන් -
බලන් එබදු මල්
බක්මාසේ මංගල්ලේ ගමට ඇවිල්ලා
මීන රාශියෙන් හෙමිහිට මේෂ රාශියට පැමිණෙනි
හිරු දෙවිඳුගේ මංගල්ලේ මේන් බලල්ලා
සිත ගෙ පැතුම් ඉටු වේ -
මුවගෙ සිනා නැගේ
සිරිලක සිරි අවුරුදු සිරි මේ

ගමේ ගැටවු ගැටිස්සියන් ගම් මැද්දේ රංචු ගැසී
අවුරුදු ජන කෙළි අතරේ කරක් ගහන්ටා
ආච්චිගේ තාච්චියේ හැඩට නටන කොණ්ඩ කැවුම්
රහ බලන්ට වරෙව් වරෙව් මෙහෙට වරෙල්ලා

සිතගේ පැතුම් ඉටුවේ - මුවගේ සිනා වෑහේ
සිරිලක සිරි අවුරුදු සිරි මේ

දෙමිනස දුරු වෙන්ඩයි
පසුගිය දොහේ අඹර දබර දුරුවෙලාම යන්නයි
සිතගේ පැතුම් ඉටු වේ - මුවගෙ සිනා වෑහේ
සිරිලක සිරි අවුරුදු සිරි වේ

කුඹක් ගසේ ඔන්චිල්ලේ නැගෙනා වාරම් මැද්දේ
ආන් බලන් ටිකිරි නගා රන් ඔන්චිල්ලේ
රෑක නැකතේ වැඩ ඇල්ලේ - මුළු ගමේම හරි සද්දේ
නැකත් වෙලාවත් කිට්ටුයි - වරෙවු ළමයිනේ
සිතගෙ පැතුම් ඉටු වේ - මුවගෙ සිනා වෑහේ//
සිරිලක සිරි අවුරුදු සිරි මේ - සිරිලක සිරි අවුරුදු සිරි මේ//
(රෝහණ බැද්දගේ)